# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1795/52 - 2013 පෙබරවාරි මස 01 වැනි සිකුරාදා - 2013.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ගුවන් සංතරණ රෙගුලාසි 1955

රෙගුලාසි අංක 126 යටතේ කරනු ලබන දැනුම්දීමයි

**මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ගුවන් ප්‍රවාහන සේවා සඳහා විවෘත කිරීම**

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර සහ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශය තුළ ඉදිකරනු ලැබ ඇති මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, දේශීය සහ ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සේවා සඳහා 2013 මාර්තු මස 18 වැනි දින විවෘත කරනු ලබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන සහ ශ්‍රී ලංකාවෙන් විදේශීය ගමනාන්ත කරා පිටත්ව යන ගුවන් යානාවලට, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ගොඩබෑමට සහ එම ගුවන් තොටපොළෙන් පිටත් වීමට අවසර ලැබෙන අතර එකී ගුවන් යානාවන්ට, එම ගුවන් තොටුපලේදී මගීන්, ගුවන් බඩු සහ ගුවන් තැපැල් උචිත පරිදි පැටවීම සහ ගොඩබෑමට අවසර ලැබෙනු ඇත.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටපොළෙන් පිටත් වන සහ ගුවන් තොටුපළට ළඟා වන සියලු ගුවන් යානා මෙහෙයුම්, ශ්‍රී ලංකාවේ නීති, රෙගුලාසි, නියමයන් සහ ක්‍රියාවෙහි යොදවා ඇති ප්‍රමිතීන් සහ පහත අත්සන් කරන අය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගගන නාවික තොරතුරු ගොනුවෙහි දක්වා ඇති ස්ථාපිත පටිපාටිවලට අනුකූලව අදාළ පැමිණීම් හා පිටත්වීම් සිදු කළ යුතු ය.

ගුවන් තොටුපොළ වෙත පැමිණෙන සහ ඉන් පිටත්වන සෑම ගුවන් මගියෙකුම අදාළ ශ්‍රී ලංකාවේ නීති, රෙගුලාසි, නියමන් සහ ක්‍රියාවෙහි යොදවා ඇති ප්‍රමිතීන් සහ පහත අත්සන් කරන අය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගගන නාවික තොරතුරු ගොනුවෙහි දක්වා ඇති ස්ථාපිත පටිපාටිවලට අනුකූල විය යුතුය. එහිදී අදාළ රාජ්‍ය අධිකාරී බලධරයන් වන ශ්‍රී ලංකා රේගුව, ආගමන හා විගමන, ගුවන් සේවා ආරක්ෂක, මහජන සෞඛ්‍ය සහ ශාක හා සත්ව නිරෝධායන වැනි ආයතන විසින් පවත්වනු ලබන නිල සෝදිසි කිරීම්වලට මගියා සහ ඔවුන්ගේ ගමන් මලු ලක් කරනු ලැබිය හැක.

ගුමන් මගින් රැගෙන එනු ලබන සහ රැගෙන යනු ලබන භාණ්ඩ, ලිපි සහ අනෙකුත් ද්‍රව්‍ය ශ්‍රී ලංකා ගගන නාවික තොරතුරු ගොනුවෙහි දැක්වෙන ශ්‍රී ලංකාවේ නීති, රෙගුලාසි, නියමයන්, සහ ක්‍රියාවෙහි යොදවා ඇති ප්‍රමිතීන් සහ ස්ථාපිත පටිපාටිවලට අනුකූල විය යුතුය. එහිදී අදාළ රාජ්‍ය අධිකාරි බලධරයන් වන ශ්‍රී ලංකා රේගුව, ආගමන හා විගමන, ගුවන් සේවා ආරක්ෂක, මහජන සෞඛ්‍ය සහ ශාක හා සත්ව නිරෝධායන වැනි ආයතන විසින් පවත්වනු ලබන සෝදිසි කිරීම්වලට එම භාණ්ඩ, ලිපි සහ අනෙකුත් ද්‍රව්‍ය ලක් කරනු ලැබිය හැක.

ගුවන් තොටුපල මෙහෙයුම්කරුවකු විසින් අදාළ වාහනයට හෝ පුද්ගලයෙකුට හෝ නිකුත් කරනු ලැබූ ගුවන් තොටුපලට ප්‍රවේශ වීමේ වලංගු අවසර පත්‍රය පැහැදිලිව ප්‍රදර්ශණය කිරීමකින් තොරව, කිසියම් වාහනයක් හෝ පුද්ගලයකු ඔහු විසින් ගෙන යන ද්‍රව්‍ය ද ඇතුළුව, ගුවන් තොටුපොළේ ආරක්ෂිත රක්ෂිත ප්‍රදේශයක් ලෙස නම් කරනු ලැබ ඇති ප්‍රදේශයකට ඇතුළුවීම හෝ රැඳී සිටීම හෝ නොකළ යුතුය. වලංගු ගමන් ලියකියවිලි සහ ගුවන් තොටුපොළට පැමිණෙන හෝ ගුවන් තොටුපොළින් පිටත්වන යානාවක් සඳහා නිකුත් කරනු ලැබූ තත්කාලීන ගොඩවීමේ ප්‍රවේශ පත්‍රයක් අතැති ගුවන් මගියකු සම්බන්ධයෙන් ඉහත කී අවශ්‍යතාව බල නොපවත්වනු ඇත.

එච්. එම්. සී. නිමල්සිරි,
අධ්‍යක්ෂ ජෙනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී.

2013 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ 02,
නො. 04, හුණුපිටිය පාර,
සිවිල් ගුවන් සේවා අධිකාරියේ දී ය.

02 - 608

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.